තේමා ලිපි

# පුත්තලමේ පොල්පලා සියඹලාවලට සාධාරණ මිලක් සහ වෙළඳපොළක්

**මෙම කෘෂි ද්‍රව්‍ය ගොවි සංවිධාන මගින් මිලදී ගෙන අලෙවි කිරීම සඳහා පෞද්ගලික සමාගම්, අපනයනකරුවන්, මෙන්ම රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධතා ගොඩ නැගීම කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහතකී කෘෂි නිෂ්පාදනවලට එම තෝරාගත් ප්‍රදේශවල ගොවීන්ට ඉතාමත් හොඳ මිලක් මෙන්ම වෙළඳපොළක්ද ලබා දීමට හැකිවිය. උදාහරණයක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භයේ තෝරා ගත් ප්‍රදේශවල පොල්පලා මිල කි. 1ක් සඳහා ගොවියාට ගෙවා ඇත්තේ රු.6 ත් 8ත් අතර ගණනකි. නමුත් මෙම ව්‍යාපෘතිය මගින් පොල්පලා කිලෝවක් සඳහා රු.20ත් 25 ත් අතර මිලක් ගොවියා අතට ලබාදීමට හැකිවිය. මේ වන විට රු.24 ගණනේ පොල්පලා කිලෝ 8000 කට ආසන්න ප්‍රමාණයක් අපනයන සමාගම්වලට අලෙවිකල හැකිවූ අතර අනෙකුත් සියළුම පොල්පලා කිකලෝ එකක් රු.20 ත් 25ත් අතර මිලකට මිල ඉහළ දමා ඇත. එමෙන්ම පසුගිය කන්නයේ සියඹලා අලෙවි වැඩසටහනද තවත් ඉතාමත් සාර්ථක වැඩසටහනකි.**

ගොවීන්ගේ නිෂ්පාදන සාධාරණ මිල ගණන් යටතේ මිලදී ගැනීම, අලෙවි කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ඉක්මණින් ක්‍රියාත්මක විය යුතුව ඇති බව කෘෂිකර්ම ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශය කියයි. (දිවයින 1997 මැයි 26) ලංකාවේ ගොවීන් දහසකුත් එකක් ප්‍රශ්න මධ්‍යයේ නිෂ්පාදනය කරනු ලබන කෘෂි නිෂ්පාදනවලට වෙළඳපොළක් මෙන්ම සාධාරණ මිලක් නොලැබීම අද සාමාන්‍ය ප්‍රශ්නයක් බවට පත්ව ඇත. මේ නිසා රට පුරාම ගොවීහු මේ ප්‍රශ්නයට විසඳුම් නොමැතිව මහත් අසීරු තත්ත්වයකට පත්ව සිටිති. විශේෂයෙන් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වන වී, මිරිස්, ලූණු, අර්තාපල්, යනාදිය සම්බන්ධයෙන් මේ ප්‍රශ්නය ඉතාමත් උග්‍ර මට්ටමක පවතී. මේ රටෙහි බලයට පත්වූ සෑම රජයක්ම මේ ප්‍රශ්න සඳහා විවිධ උපාය උපක්‍රම භාවිතා කළත් ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකිව ඒවා නාම මාත්‍ර සංවර්ධන වැඩසටහන් බවට පත්ව ඇත. මෙහිදී විශේෂයෙන් ගොවි ජනතාව වෙනුවෙන් කටයුතු කිරීමට, සොයා බැලීමට ස්වාධීන අයිතියක් ඇති එකම ආයතනය වන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් මෙම ගොවීන්ගේ දහසකුත් එකක් ප්‍රශ්න ගැන කාලයක් තිස්සේ කතා කළත්, ඒවාට සවන්දීම හෝ ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති සකස් කිරීමේදී පවා නොසලකා හැර තිබීම අද රටේ දස දෙසින් නැගෙන ගොවි අදෝනාවලට ප්‍රධාන හේතුව බව නිසැකවම කිව හැකිය.


**කෘෂි සම්පත් කළමණාකරන අංශයේ**
**ප.පු.නි**
**එම්.එස් සේනානායක විසිනි.**


මෙයින් ගොවීන් දැඩි අසීරු තත්ත්වයකට පත්කර ඇති ගොවි ද්‍රව්‍ය සාධාරණ මිලකට අලෙවි කර ගත නොහැකිවීම යන ප්‍රශ්නය පිළිබඳව අප ආයතනය විවිධ පර්යේෂණ මෙන්ම අත්හදා බැලීම් කර ඇති අතර, ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ගොවීන්ගේ නිෂ්පාදන ගොවි සංවිධාන මගින් සාධාරණ මිලකට අලෙවි කර දීම සඳහා දැනට පුත්තලම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතියක් ක්‍රියාකාරී පර්යේෂණයක් ලෙස ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය 1996 වසරේ ආරම්භ කළ අතර එවකට පුත්තලම දිස්ත්‍රික්කයේ තිබූ අතිරික්ත නිෂ්පාදන වන සියඹලා, දිවුල්, පොල්පලා ඇතුළු සිංහල බෙහෙත් බඩු අලෙවි කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු, ගොවීන් දැනුවත් කිරීමේ

කටයුතු ඉතාමත් සාර්ථක අන්දමින් කර ඇත.

මෙහිදී පළමුවෙන්ම අතිරික්ත කෘෂි නිෂ්පාදන ඇති ප්‍රදේශ හඳුනා ගත් අතර, එම ප්‍රදේශවල ඇති ක්‍රියාකාරී ගොවි සංවිධාන මේ කාර්යය සඳහා තෝරා ගන්නා ලදි. ඉන් පසුව මෙම ගොවි සංවිධාන නියෝජිතයන්ට කෘෂිකාර්මික ද්‍රව්‍ය වෙළඳපොලට සුදුසු පරිදි සකස් කිරීම, රැස් කිරීම, ප්‍රවාහනය, මිලදී ගැනීම යනාදිය පිළිබඳ මනා පුහුණුවක් ලබා දෙන ලදී. මේ පුහුණුව ගොවි නියෝජිතයන් මාර්ගයෙන් ප්‍රදේශයේ සියළුම ගොවීන් වෙත ලබාදීමට කටයුතු කර ඇත.

අනතුරුව මෙම කෘෂි ද්‍රව්‍ය ගොවි සංවිධාන මඟින් මිලදී ගෙන අලෙවි කිරීම සඳහා පෞද්ගලික සමාගම්, අපනයනකරුවන්, මෙන්ම රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධතා ගොඩ නැගීම කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහතකී කෘෂි නිෂ්පාදනවලට එම තෝරාගත් ප්‍රදේශවල ගොවීන්ට ඉතාමත් හොඳ මිලක් මෙන්ම වෙළඳපොලක්ද ලබා දීමට හැකිවිය. උදාහරණයක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භයේ තෝරා ගත් ප්‍රදේශවල පොල්පලා මිල කි. 1ක් සඳහා ගොවියාට ගෙවා ඇත්තේ රු.6 ත් 8ත් අතර ගණනකි. නමුත් මෙම ව්‍යාපෘතිය මඟින් පොල්පලා කිලෝවක් සඳහා රු.20ත් 25 ත් අතර මිලක් ගොවියා අතට ලබාදීමට හැකිවිය. මේ වන විට රු.24 ගණනේ පොල්පලා කිලෝ 8000 කට ආසන්න ප්‍රමාණයක් අපනයන සමාගම්වලට අලෙවිකළ හැකිවූ අතර අනෙකුත් සියළුම පොල්පලා කිලෝ එකක් රු.20 ත් 25ත් අතර මිලකට මිල ඉහළ දමා ඇත. එමෙන්ම පසුගිය කන්නයේ සියඹලා අලෙවි වැඩසටහනද තවත් ඉතාමත් සාර්ථක වැඩසටහනකි.

පසුගිය කන්නයේ සියඹලා අස්වනු නෙළීම ආරම්භ කරන විට කිලෝ එකකට රු.4 ත් 6 ත් අතර මිලක් පැවතුනි. නමුත් මෙම වැඩසටහන මඟින් ස.තො.ස. හරහා රු.9 ත් 11 ත් අතර මිලකට සියඹලා මිලදී ගැනීම සඳහා කටයුතු කළ නිසා සියඹලා මිල කිලෝ එකක් සඳහා රු.10 කට වඩා ඉහළ මිලක් ගොවියාට ලබාගත හැකි විය. ඉදිරියේදීද ගොවීන්ගේ නිෂ්පාදනවලට හොඳ මිලක් ලබාදීම සඳහා මෙවැනි වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. සියඹලා හා පොල්පලා අලෙවි උපාය මාර්ගවලින් ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය පසු කාලීනව ගොවීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

## පොල්පලා වගා කිරීම

ලංකාවේ ප්‍රථම වරට ගොවීන් විසින් ආර්ථිකමය වගාවක් ලෙස පොල්පලා වගාව ආරම්භ කරන ලද්දේ මෙම ව්‍යාපෘතිය පදනම් කර ගෙනය. කාලයක් තිස්සේම පුත්තලම දිස්ත්‍රික්කයේ තබ්බෝව, තේවනුවර, ප්‍රදීපාගම, වැනි ප්‍රදේශවල ගොවීන් පුරුදුවී සිටියේ අසළ ඇති වන ලැහැබ්වලින් එකතු කර ගන්නා පොල්පලා අතරමැදියන්ට කීයකට හෝ අලෙවි කර එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීමටයි. මෙයට හේතුව එම ප්‍රදේශවල පවතින කටුක තත්ත්වයයි. කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති නිසා ස්වාභාවිකව වැඩෙන සියඹලා, පොල්පලා, දිවුල් සහ සිංහල බෙහෙත් බඩු වර්ග යනාදිය එකතු කිරීම සහ අලෙවිය සමහර ගොවීන්ගේ ප්‍රධානතම ආදායම් මාර්ගය විය. කෙසේ හෝ මෙම ව්‍යාපෘතිය තුළින් මෙම ද්‍රව්‍යවල වටිනාකම ගොවීන්ට අවබෝධ කරදී ඒවාට ඇති වෙළඳපොළ පිළිබඳ දැනුවත් කරන ලදී. ඉන් අනතුරුව එම ප්‍රදේශවල ගොවීන්ගෙන්ම සැදුම්ලත් ගොවි සංවිධාන මඟින් මෙම ද්‍රව්‍ය එකතු කිරීම ගබඩා කිරීම, යනාදිය පිළිබඳව මනා පුහුණුවක් ලබා දෙන ලදී. මෙම පුහුණුව පදනම් කරගෙන වෙළඳපොළට අවශ්‍ය පරිදි එම භාණ්ඩ සකස් කිරීමට ගොවියා පුරුදු විය. එහිදී උසස් තත්ත්වයේ භාණ්ඩවලට හොඳ මිලක් හා වෙළඳපොළක් ලබා ගත හැකි බව ඔවුන් තේරුම් ගත්හ.

එපමණක් නොව දිගින් දිගටම මෙසේ පොල්පලා කැලෑවෙන් ඉවත් කිරීම නිසා කල් යාමේදී පොල්පලා හිඟයක් ඇති විය හැකි බවද ඔවුහු අවබෝධ කර ගත්හ. කටුක දේශගුණයට ඔරොත්තුදෙන පොල්පලා ගස ඕනෑම ඉඩමක වගා කළ හැකි බවද ඔවුන් තේරුම් ගෙන ඇත. අප වැඩසටහන මඟින්ද පොල්පලා වගා කිරීම, එහි ලාභදායිත්වය

යනාදිය පිළිබඳව ගොවීන් දැනුවත් කරන ලදී. මේ කාර්යය සඳහා පොල්පලා අපනයන සමාගමක් සම්බන්ධ කර ගත් අතර එහි නිලධාරීන් ගොවීන් ලභටම ගොස් පොල්පලා වගා කරන ආකාරය ගොවීන්ට පැහැදිළි කර දුන් අතර, පොල්පලා වගා කිරීමට කැමැති අයට බීජ නොමිලයේ ලබාදීමටද ඉදිරිපත් විය. මෙසේ බීජ ලබාදී එම බීජවලින් වගා කරනු ලබන පොල්පලා උපරිම මිලකට ලබා ගැනීමටද එම සමාගම එකඟ විය. මේ නිසා ගොවීන් ඔවුන්ගේ වගා නොකරන ඉඩම්වල පොල්පලා වගා කිරීම ආරම්භ කර ඇත. අද මෙම ප්‍රදේශවල ගොවීන් විශාල සංඛ්‍යාවක් පොල්පලා වගාව කරනු ලබයි. පොල්පලා නියමිත ප්‍රමිතියට වියළීම පිළිබඳවද ගොවීන්හට හොඳ අවබෝධයක් ලැබී ඇත

මෙම තත්ත්වය කෘෂි අලෙවිකරණයේ නව නැම්මක් ලෙස විග්‍රහ කළ හැකිය. ප්‍රදේශයේ කිසිදු අවධානයකින් තොරව කරගෙන ගිය පොල්පලා එකතු කිරීමේ ව්‍යාපාරය පොල්පලා වගා කිරීමේ ව්‍යාපාරයක් බවට පත්වී ඇත. ගොවි සංවිධානවල ක්‍රියාකාරිත්වයද පොල්පලා නිසාම සැළකිය යුතු වර්ධනයක් සිදුවී ඇත. එම සංවිධානවල අලෙවි නියෝජිතයන් පොල්පලා තොග එකතු කර ලොරියකට ප්‍රමාණවත් තොගයක් රැස්වූ පසු කෙළින්ම අපනයන සමාගමට දුරකථනයෙන් දැනුම් දෙනු ලබයි. එම සමාගමෙන් එදිනම හෝ පසුදින ලොරියක් එම ප්‍රදේශවලට ගොස් පොල්පලාවලට එම මොහොතේම මුදල් ගෙවා රැ ගෙන එයි. මේ තත්ත්වය නිසා ගොවීන්ට යම් විශ්වාසයකින් යුතුව කටයුතු කිරීමේ හැකියාව ලැබී ඇත. පොල්පලාවලින් පටන්ගත් මෙම ව්‍යාපෘතිය අද එම ප්‍රදේශවල ඇති ඕනෑම අතිරික්ත කෘෂි ද්‍රව්‍යයක් දක්වා ව්‍යාප්ත කිරීමට හැකියාව ඇත. මෙම ව්‍යාපාතිය පුත්තලමේ පොල්පලාවලට අනතුරුව අනෙකුත් කෘෂි නිෂ්පාදන සඳහාද යොදා ගත හැකි වන අතර, ඉන් නොනැවතී තවත් දිස්ත්‍රික්ක කිහිපයකද ව්‍යාප්ත කිරීමට දැනටමත් සැලසුම් කර ඇත. මේ තුළින් ගොවියාට හොඳ ලාභයක් ලබා ගත හැකි වන අතර ඔවුන් තුළ සංවිධානය වීමේ හැකියාවද වර්ධනය වෙයි.

පුත්තලම දිස්ත්‍රික්කයේ මෙම කෘෂි අලෙවි කටයුතුවල සාර්ථක අත්දැකීම් පදනම් කර ගෙන මෙම වැඩසටහන තවදුරටත් සාර්ථකව ව්‍යාප්ත කිරීමේ අදහසින් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ උපදෙස්මත ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්කයක් වන මොණරාගල දිස්ත්‍රික්කයටද ව්‍යාප්ත කිරීමේ කටයුතු මෑතදී ආරම්භ කරන ලදී. මෙහිදී සමුපකාරය, ස.තො.ස., ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මෙන්ම පෞද්ගලික අංශයේ සමාගම් රැසක්ද වැඩසටහනට සහභාගි කරවා ගැනීමට අදහස් කර ඇත. මෙහිදී ගොවි සංවිධානවලට ප්‍රමුඛත්වයක් දෙනු ලබන අතර, ගොවි සංවිධානවල ප්‍රධානත්වයෙන් එම තෝරා ගත් ප්‍රදේශවල කෘෂි ද්‍රව්‍ය සාධාරණ මිලකට අලෙවි කිරීමේ කටයුතු සකස් කරමින් පවති. මෙහිදී ඉතාමත්ම වැදගත් කර්යය වන ගොවීන් දැනුවත් කිරීමේ කටයුතු සකස් කරමින් පවතී. මෙහිදී ඉතාමත් වැදගත් කාර්යය වන ගෙවීන් දැනුවත් කිරීමේ කටයුතු මේ දිනවල කරගෙන යනු ලබන අතර, සමුපකාරය, ස.තො.ස. වැනි රාජ්‍ය ආයතන මෙන්ම පෞද්ගලික සමාගම් රැසක් සමඟද සාකච්ඡා කරමින් පවතී. මෙවන් වැඩසටහන් ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්ක කිහිපයකම ක්‍රියාත්මක කිරීම තුළින් ගොවීන්ගේ ප්‍රධාන ප්‍රශ්නයට පහසුවෙන්ම ඔවුන්ගේම සංවිධාන තුළින් පිළිතුරු ලබාදීමට හැකිවේයයි ආයතනය අපේක්ෂා කරයි. එමෙන්ම ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන වෙළඳපොළට අවශ්‍ය වන ආකාරයට හොඳ තත්වයකින් හා නිමාවකින් සකස් කිරීමටද වැඩසටහන උනන්දු කරවීමක් කරයි.

මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ අනෙකුත් වගකිවයුතු අංශවලින්ද පූර්ණ අනුග්‍රහය ලැබෙන්නේ නම් අප ආයතනයේ සිටින ඒ ඒ ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ ඥානයද උපරිම අන්දමින් උපයෝගි කර ගෙන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් ගොවීන්ගේ දැවෙන ප්‍රශ්න රැසකට සාර්ථක ලෙස විසඳුම් ලබාදිය හැකියි.